# <u>උතුරු මැද පළාත් සභාව</u>
# <u>2012 වර්ෂය සඳහා සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන්</u>
# <u>ලියාපදිංචි කිරීම.</u>

2012 වර්ෂය සඳහා උතුරු මැද පළාත් සභාවේ සියළුම අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු / ආයතන වලට අවශ්‍ය ඉදිකිරීම්, ද්‍රව්‍ය සහ සේවාවන් සැපයීම සඳහා ලියාපදිංචි වීමට කැමති රාජ්‍ය / සංස්ථා / රජයට පවරා ගත් වෙළඳ ආයතන / සැපයුම්කරුවන් / නිෂ්පාදකයින් / බෙදාහරින්නන් සහ ඉදිකිරීම් වැඩ සඳහා කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## <u>කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම.</u>

**<u>සුදුසුකම් :-</u>**

01. උතුරු මැද පළාතේ ස්ථිර පදිංචි කොන්ත්‍රාත්කරුවන්ට සහ පළාත තුළ ස්වකීය ව්‍යාපාර හෝ ශාඛා ආයතන පවත්වා ගෙන යන කොන්ත්‍රාත්කරුවන්ට කොන්ත්‍රාත් සඳහා ලියාපදිංචි විය හැකි අතර, රුපියල් ලක්ෂ 50 ඉක්මවන ඉදිකිරීම් සඳහා සෑම කොන්ත්‍රාත්කරුවෙක්ම " ඉක්ටැඩ් " ආයතනයේ ලියාපදිංචි වී සිටිය යුතුය. (අයදුම් පත්‍රය සමග පිටපතක් ඉදිරිපත් කළ යුතුය.)

02. 2010, 2011 වර්ෂ වල සිවිල් ඉංජිනේරු කටයුතු පිළිබඳව සිය හැකියාවන් ඉදිරිපත් කර සනාථ කළ යුතුය. (අයදුම් පත්‍රය සමග පිටපත් ඉදිරිපත් කළ යුතුය.)

03. සුදුසුකම් සහ වත්කම් සනාථ කෙරෙන සහතික ඉදිරිපත් කළ යුතුය. (අයදුම් පත්‍රය සමග පිටපත් ඉදිරිපත් කළ යුතුය.)

## <u>සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම.</u>

**<u>සුදුසුකම් :-</u>**

01. ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර තිබිය යුතුය. (අයදුම් පත්‍රය සමග පිටපතක් ඉදිරිපත් කළ යුතුය.)

02. (අ). සම්පූර්ණයෙන්ම දැවයෙන් නිම කරන ලද භාණ්ඩ සැපයීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ අවසර පත්‍රය ලබා තිබිය යුතුය. (අයදුම් පත්‍රය සමග පිටපතක් ඉදිරිපත් කළ යුතුය.)

(ආ). සැපයීම් ද්‍රව්‍ය විකිණීම සහ සේවා සැපයීම සඳහා පවත්වා ගෙන යන ආයතන ඒ සඳහා පළාත් පාලන ආයතනයෙන් ලබා ගන්නා ලද බලපත්‍රය සහ එය පවත්වා ගෙන යාම සඳහා පළාත් පාලන ආයතනයේ ලියාපදිංචි වීමට අදාලව නෛතිකව ලබා ගත යුතු බලපත්‍ර ලබා ගෙන තිබිය යුතුය. සෑම ව්‍යාපාරික ආයතනයක්ම තම ව්‍යාපාරය පවත්වා ගෙන යාම වෙනුවෙන් පළාත් පාලන ආයතනයට බදු මුදල් **(වෙළඳ බලපත්‍ර ගාස්තු)** ගෙවා තිබිය යුතුය. (2011 වර්ෂයේ බදු මුදල් ගෙවූ රිසිට් පත්‍රයේ පිටපතක් අයදුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය)

(ඇ) පළාත් පාලන ආයතන වෙත වෙළඳ බලපත්‍ර ගාස්තු නොගෙවනු ලබන, **සමාගම් පණත යටතේ සංස්ථාගත කිරීමේ සහතිකය හිමි සමාගම්** 2011 වර්ෂයට අදාලව පිරිවැටුම් බදු/ආදායම් බදු ගෙවන ලද බවට තහවුරු වන ලියවිලි ඉදිරිපත් කළ යුතුය.

03. 2010, 2011 වර්ෂ වල සැපයුම් හා සේවා සිදුකර ඇත්නම්, එම සේවා සම්පූර්ණ කර ඇති බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

04. සැපයුම් හා සේවා ඇණවුම් සැපයීමට අවශ්‍ය මූල්‍යමය සහ අනෙකුත් හැකියාවන් ඇති බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

05. ආනයනය කරන සැපයුම්කරුවකු නම් ප්‍රධාන නියෝජිතයෙකු ද / නියෝජිතයා ද / උප නියෝජිතයෙකු ද යන්න ලිඛිතව සනාථ කළ යුතුය.

**<u>අයදුම් කිරීම හා ලියාපදිංචි කිරීම :-</u>**

01. **2011.09.02 දින ප.ව. 3.00 දක්වා** මෙම කාර්යාලයෙන් නිකුත් කරන අයදුම්පත් මගින් ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කළ හැක.

02. ඉල්ලුම්පත් සමග විස්තර පත්‍රිකාව ලබා ගැනීම සඳහා **සෑම අයදුම්පතක් සඳහාම රු. 100.00** ක ආපසු නොගෙවන මුදලක් මුදලින් ගෙවිය යුතුය. තැපැලෙන් අයදුම්පත්‍ර ලබා ගැනීම සඳහා මුදල් ඇණවුමක් එවිය යුතුය. මුදල් ඇණවුමකින් ගෙවීම් කරන්නේ නම් ලබන්නා " **ප්‍රධාන ලේකම්, උතුරු මැද පළාත** " සහ ගෙවන කාර්යාලය " **අනුරාධපුරය** " යන්න සඳහන් කළ යුතුය.

03. **එක් එක් අයිතමය සඳහා ලියාපදිංචි වීමට වෙන වෙනම ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ යුතුය.**

04. ලියාපදිංචි ගාස්තු ඉහත පරිදි මුදලින් ගෙවිය යුතු අතර, එම මුදල ආපසු ගෙවනු නොලැබේ. ගාස්තු ප්‍රමාණයන් පහත පරිදි වේ.

**(අ)** <u>සැපයුම්කරුන් සඳහා ලියාපදිංචි ගාස්තු ප්‍රමාණයන්</u>

එක් එක් අයිතමය සඳහා ලියාපදිංචි වීම සඳහා රු. 250.00 ක මුදලක් ගෙවිය යුතුය.

(ආ) <u>වාහන අළුත්වැඩියාවන් සඳහා ලියාපදිංචි ගාස්තු ප්‍රමාණයන්</u>

1. " ඒ " ශ්‍රේණිය - රු. 1,000.00
2. " බී " ශ්‍රේණිය - රු. 750.00
3. " සී " ශ්‍රේණිය - රු. 500.00

(ආ) <u>කොන්ත්‍රාත් සහ ඉදිකිරීම් සඳහා ලියාපදිංචි ගාස්තු ප්‍රමාණයන්</u>

| | | | |
|---|---|---|---|
| 1. රු. ලක්ෂ 10 ට අඩු | - | රු. | 1,000.00 |
| 2. රු. ලක්ෂ 10 සිට රු. ලක්ෂ 20 දක්වා | - | රු. | 2,000.00 |
| 3. රු. ලක්ෂ 20 සිට රු. ලක්ෂ 50 දක්වා | - | රු. | 3,000.00 |
| 4. රු. ලක්ෂ 50 සිට රු. ලක්ෂ 100 දක්වා | - | රු. | 5,000.00 |
| 5. රු. ලක්ෂ 100 ට වැඩි | - | රු. | 10,000.00 |

04. අයදුම්පත්‍ර **2011.09.23 වෙනි දින ප.ව. 3.00 ට පෙර** ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් පහත සඳහන් ලිපිනයට එවීම හෝ අතින් ගෙනවිත් ගණකාධිකාරී වෙත භාරදීම හෝ කළ හැකිය. අතින් ගෙනවිත් භාරදෙනු ලබන අයදුම්පත් සඳහා රිසිට්පතක් ලබා ගත යුතුය.

05. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවර **"2012 සැපයුම්කරුවන්/කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම"** යනුවෙන් සඳහන් කළ යුතුය.

<u>**වෙනත් කොන්දේසි :-**</u>

01. මිල ගණන් කැඳවීම සහ ටෙන්ඩර් කැඳවීම ලියාපදිංචි වූ සැපයුම්කරුවන්ගෙන් සහ කොන්ත්‍රාත්කරුවන්ගෙන් කරනු ලබන අතර, උතුරු මැද පළාත් සභාවේ අවශ්‍යතාවය අනුව ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන්ගෙන් ද මිල ගණන් කැඳවීමේ අයිතිය උතුරු මැද පළාත් සභාව සතුය.

02. ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කෙරෙන අයදුම්පත් සලකා බලා සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් වෙත ඇති හැකියාවන් සහ සුදුසුකම් මත පමණක් එකී අයදුම්කරුවන් ලියාපදිංචි කිරීමේ අයිතිය හා හේතුවක් නොදක්වා ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය උතුරු මැද පළාත් සභාව සතුය.

03. ලියාපදිංචි කර ගන්නා සියළුම සැපයුම්කරුවන්ට / කොනත්‍රාත්කරුවන්ට ලියාපදිංචි කළ බව ලිඛිතව දැනුම් දෙනු ලැබේ.

04. යම් සැපයුම්කරුවෙකුගේ සේවය සැපයීම පිළිගත නොහැකි මට්ටමට දුර්වල තත්වයක පවතින්නේ නම්ද, සැපයීම් කිරීමේදී යම් වංචා සහගත ක්‍රියාවක් හෝ අක්‍රමිකතාවයක යෙදුනා යැයි, උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම්වරයා සෑහීමකට පත්වන තොරතුරු මත ආයතනය අසාදු ලේඛණයට ඇතුලත් කොට මින් ඉදිරියට සැපයුම්කරුවෙකු ලෙස පිළි නොගැනීමට කටයුතු කළ හැක. ඒ පිළිබඳව වූ පූර්ණ අයිතිය උතුරු මැද පළාතේ ප්‍රධාන ලේකම් සතු වන්නේය.

05. උතුරු මැද පළාත් සභාවේ සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන් පිළිබඳව විශේෂ සැලකිල්ලක් දක්වනු ලබන අතර, **පළාතෙන් පිටත ලියාපදිංචි වී ඇති සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන් අදාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ව්‍යාපාරික ආයතනයක් පවත්වාගෙන යන බවට වාර්තාවක් ලබා ගැනීම අනිවාර්යය වේ. (අයදුම්පතෙහි " ආ " කොටස)**

| **අයිතම අංකය** | **අයිතම විස්තරය** |
|---|---|
| **කාර්යාලයීය උපකරණ සැපයීම :-** | |
| 01-01 | කාර්යාලයීය ලී බඩු හා උපකරණ සැපයීම. - (දැව) |
| 01-02 | කාර්යාලයීය උපකරණ සැපයීම - (යකඩ, ප්ලාස්ටික් හා දැව මිශ්‍ර) |
| 01-03 | ඡායා පිටපත් යන්ත්‍ර, යතුරු ලියන, රෝනියෝ යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර හා වේලාව සටහන් කිරීමේ යන්ත්‍ර සැපයීම. |
| 01-04 | කැමරා ප්‍රොජෙක්ටර්, වීඩියෝ උපකරණ සැපයීම - (රූපවාහිනී, වීසීඩී/ඩීවීඩී යන්ත්‍ර, ඩෙක් යන්ත්‍ර, ටේප්රෙකෝඩර්, රේඩියෝ හා ඩෙක්පීස්, හිස් කැසට් පීස්) ආදිය සැපයීම. |
| 01-05 | වායු සමන යන්ත්‍ර සැපයීම. |
| 01-06 | පරිඝණක යන්ත්‍ර සැපයීම. |
| 01-07 | පාපැදි සැපයීම. |
| 01-08 | ශබ්ද විකාශන යන්ත්‍ර සැපයීම. |
| | |
| **කාර්යාලයීය පාරිභෝගික ද්‍රව්‍ය සැපයීම :-** | |
| 02-01 | ලිපි ද්‍රව්‍ය සැපයීම. |
| 02-02 | පරිඝණක පාරිභෝගික ද්‍රව්‍ය සැපයීම - (ඩිස්කට්, සීඩී/ඩීවීඩී තැටි, රිබන්) ආදිය සැපයීම. |
| 02-03 | රබර් මුද්‍රා, දින මුද්‍රා හා නාම පුවරු සැකසීම හා සැපයීම. |
| 02-04 | පානීය ජලය හා ජල සැපයුම් උපකරණ සැපයීම. |
| 02-05 | කාර්යාලයීය සනීපාරක්ෂක ද්‍රව්‍ය සැපයීම. |
| | |
| **කාර්යාලයීය සේවා සැපයීම :-** | |
| 03-01 | කාර්යාලයීය මුද්‍රණ කටයුතු, පින්තූර රාමු කිරීම, හා දැන්වීම් පුවරු ඇඳීම. |
| 03-02 | පරිඝණක හා ඡායා පිටපත් යන්ත්‍ර අළුත්වැඩියා කිරීම හා නඩත්තු සේවා. |
| 03-03 | පරිඝණක මෘදුකාංග සංවර්ධනය, ස්ථාපනය කිරීම හා උපදේශාත්මක සේවා. |
| 03-04 | ආරක්ෂක සේවා සැපයීම. |
| 03-05 | ප්‍රවාහන සේවා කුලියට සැපයීම - කුලියට වාහන සැපයීම. |
| 03-06 | කාර්යාලයීය උපකරණ අළුත්වැඩියා හා නඩත්තු සේවා. |
| 03-07 | ඇමදුම් සේවා හා සනීපාරක්ෂක සේවා සැපයීම. |
| 03-08 | වායු සමීකරණ යන්ත්‍ර අළුත්වැඩියාව හා සේවා කිරීම. |
| 03-09 | අභ්‍යන්තර දුරකථන සේවා. |
| 03-10 | පුහුණු නුපුහුණු ශ්‍රම සැපයීම - (පෙදරේරු, වඩුකාර්මික, විදුලි කාර්මික, කම්කරු ආදිය) |

| | |
|---|---|
| 03-11 | වීඩියෝ කිරීම ඡායාරූප මුද්‍රණය. |
| 03-12 | ශබ්ද විකාශන යන්ත්‍ර කුලියට සැපයීම. |
| 03-13 | උපදේශාත්මක සේවා සැපයීම - ගොවි පුහුණු. |
| 03-14 | උපදේශාත්මක සේවා සැපයීම - ව්‍යවසායකත්ව පුහුණු. |
| 03-15 | ව්‍යවසායකත්ව පුහුණු - සහභාගිත්ව ගැමි විමසුම (P.R.A.) |
| 03-16 | දේශිය ඖෂධ නිෂ්පාදනයට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර හා උපකරණ අළුත්වැඩියාව. |
| 03-17 | විදුලි උපකරණ හා විදුලි ජනක යන්ත්‍ර අළුත්වැඩියාව. |
| 03-18 | තත්ව පාලන ඒකකයේ උපකරණ සඳහා ඒවායේ අළුත්වැඩියා කටයුතු, සේවා කිරීම හා ක්‍රමාංකනය කිරීම. |
| 03-19 | තත්ව පාලන ඒකකයේ විශේෂිත වූ පර්යේෂන සඳහා ආදර්ශන ලබා ගැනීම සඳහා වන උපකරණ කුලී පදනම මත සැපයීම. |
| 03-20 | නිල ඇඳුම් සහ රෙදි මැසීමේ (තිර රෙදි, වෙනත්) සේවා සැපයීම. |
| | |
| **පාසැල් උපකරණ සැපයීම :-** | |
| 04-01 | පාසැල් ලී බඩු උපකරණ සැපයීම (ඩෙස්ක්, පුටු, මේස) - දැව. |
| 04-02 | පාසැල් උපකරණ සැපයීම (ඩෙස්ක්, පුටු, මේස) - යකඩ, ප්ලාස්ටික් හා දැව මිශ්‍ර. |
| 04-03 | චිත්‍ර විෂය සම්බන්ධ උපකරණ සැපයීම. |
| 04-04 | විද්‍යා රසායනාගාර විෂය සම්බන්ධ උපකරණ සැපයීම. |
| 04-05 | සංගීත / නැටුම් / තූර්යවාදන විෂය සම්බන්ධ උපකරණ සැපයීම. |
| 04-06 | පාසැල් සිතුං හා රටහුණු සැපයීම. |
| 04-07 | විශේෂ අධ්‍යාපනික විෂය උපකරණ සැපයීම - (අඳ, ගොළු හා බිහිරි ළමුන් සඳහා) |
| 04-08 | නොවිධිමත් අධ්‍යාපන උපකරණ සැපයීම. |
| 04-09 | ගුණාත්මක යෙදවුම් උපකරණ සැපයීම. |
| 04-10 | පාසල් වාර විභාග ප්‍රශ්ණ පත්‍ර මුද්‍රණය කිරීම |
| | |
| **පුස්තකාල පොත් හා ග්‍රන්ථ සැපයීම :-** | |
| 05-01 | පුස්තකාල පොත් හා ග්‍රන්ථ සැපයීම. |
| | |
| **ක්‍රීඩා භාණ්ඩ හා උපකරණ සැපයීම :-** | |
| 06-01 | ක්‍රීඩා භාණ්ඩ සැපයීම. |
| 06-02 | ක්‍රීඩා භාණ්ඩ අළුත්වැඩියාව. |
| 06-03 | ක්‍රීඩා නිල ඇඳුම් සැපයීම |
| | |
| **ඇගලුම් කර්මාන්තයට අවශ්‍ය ද්‍රව්‍ය සැපයීම :-** | |
| 07-01 | සියළුම වර්ග වල මහන මැෂින් හා අමතර කොටස් සැපයීම. |
| 07-02 | රෙදි පිළි, නූල් වර්ග හා ඩයි වර්ග සැපයීම. |
| | |

| | |
|---|---|
| **ධීවර, පශු සම්පත් හා කෘෂිකාර්මික :-** | |
| 08-01 | කෘෂි යන්ත්‍ර සැපයීම - (ධාන්‍ය පිටි සැකසීමේ යන්ත්‍ර/තල පොතු ඉසින යන්ත්‍ර/ගොයම් කපන යන්ත්‍ර/පොප්කෝන් නිෂ්පාදන යන්ත්‍ර) |
| 08-02 | කෘෂිකාර්මික උපකරණ සැපයීම - {කමත් අසුරනු/පැරපුට් තවාන් තැටි/ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති/සෙවන දැල්/කුන්තානි(දහයියා අඟුරු කරනු ලබන බැරල්)/වී තම්බන බැරල්/මෙට්‍රික් මී මැසි පෙට්ටි} |
| 08-03 | කෘෂිකාර්මික උපකරණ සැපයීම - (වතුර පොම්ප, වෙනත් කෘෂි ආම්පන්න) |
| 08-04 | ලෝහ භාණ්ඩ සැපයීම - (කැති, පොරෝ, උදලු, නගුල් ආදිය) |
| 08-05 | කෘෂිකාර්මික රෝපණ ද්‍රව්‍ය සැපයීම - පැල වර්ග |
| 08-06 | කෘෂිකාර්මික රෝපණ ද්‍රව්‍ය සැපයීම - බීජ වර්ග (එළවළු බීජ/ආනයනික ලොකු ළූනු බීජ/ආනයනික බඩ ඉරිඟු බීජ/පැපොල් බීජ/වෙනත් බීජ වර්ග) |
| 08-07 | පොහොර වර්ග සැපයීම. |
| 08-08 | කෘෂි රසායනික ද්‍රව්‍ය සැපයීම (වල් නාශක/කෘමි නාශක) |
| 08-09 | කෘෂිකාර්මික හා ආර්ථික කටයුතු සඳහා යොදා ගන්නා සියළුම සතුන් සැපයීම. |
| 08-10 | ධීවර කර්මාන්තය සඳහා මත්ස්‍ය හා මත්ස්‍ය ඇඟිලිලන් සැපයීම. |
| 08-11 | ධීවර කර්මාන්තය සඳහා උපකරණ සැපයීම. |
| | |
| **හස්ත කර්මාන්තය සඳහා උපකරණ සැපයීම :-** | |
| 09-01 | වඩු වැඩ හා මේසන් වැඩ සඳහා උපකරණ සැපයීම. |
| 09-02 | ලුහු ඉංජිනේරු උපකරණ සැපයීම. |
| 09-03 | හස්ත කර්මාන්ත උපකරණ සැපයීම. |
| 09-04 | ඉරූ දැව සැපයීම. |
| | |
| **සෞඛ්‍ය ආරක්ෂක උපකරණ හා ඖෂධ වර්ග හා සේවා සැපයීම :-** | |
| 10-01 | බටහිර ඖෂධ වර්ග සැපයීම. |
| 10-02 | ආයුර්වේද ඖෂධ වර්ග සැපයීම. |
| 10-03 | ශල්‍ය උපකරණ සැපයීම. |
| 10-04 | ශල්‍ය පාරිභෝජ්‍ය ද්‍රව්‍ය සැපයීම. |
| 10-05 | හෘද රෝග ඒකක වෛද්‍ය උපකරණ සැපයීම. |
| 10-06 | විකිරණ යන්ත්‍ර හා එක්ස්රේ පටල ඇතුළු අනෙකුත් විකිරණ උපාංග සැපයීම. |
| 10-07 | රසායනාගාර උපාංග සැපයීම. |
| 10-08 | රසායනාගාර පරීක්ෂණ සඳහා වන පාරිභෝජ්‍ය ද්‍රව්‍ය හා රසායනික ද්‍රාවණ සැපයීම. |
| 10-09 | උගුර, කන, නාස වෛද්‍ය උපකරණ සැපයීම. |
| 10-10 | අක්ෂි වෛද්‍ය උපකරණ සැපයීම. |
| 10-11 | විකලාංග වෛද්‍ය උපකරණ හා පාරිභෝජ්‍ය ද්‍රව්‍ය සැපයීම. |
| 10-12 | දන්ත ශල්‍ය වෛද්‍ය මෙවලම් හා ද්‍රාවණ සැපයීම. |
| 10-13 | වෙනත් වෛද්‍ය උපකරණ හා පාරිභෝජ්‍ය උපාංග හා ද්‍රව්‍ය සැපයීම. |

| | |
|---|---|
| 10-14 | දේශීය ඖෂධ නිෂ්පාදනයට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සැපයීම. |
| 10-15 | රෝහල් ඇඳන්, ස්ක්‍රීන්, රෝද පුටු, සූතිකාගාර ඇඳන්, රෝහල් වලට බෙහෙත් අල්මාරි, ට්‍රොලි, රෝහලේ ස්ථාම (ලොකර්), සේලයින් ස්ටැන්ඩ් ආදිය සැපයීම. |
| 10-16 | ඔක්සිජන් හා ගෑස් සැපයීම. |
| 10-17 | මදුරු දැල් සැපයීම. |
| 10-18 | මෙට්ට සැපයීම. |
| 10-19 | දර සැපයීම. |
| 10-20 | මුළුතැන්ගෙයි උපකරණ සැපයීම. |
| 10-21 | රෙදි සේදීම හා පිරිසිදු කිරීම. |
| 10-22 | කරණවෑම් සේවා සැපයීම. |
| 10-23 | කැලි කසල එකතු කිරීම හා ප්‍රවාහන ඇතුළු සනීපාරක්ෂක කටයුතු. |
| | |
| **ආහාර ද්‍රව්‍ය සැපයීම :-** | |
| 11-01 | කෙටි ආහාර, බීම වර්ග හා කේටරින් සේවා සැපයීම. |
| 11-02 | රෝහල් සඳහා අමු ආහාර හා පිසූ ආහාර සැපයීම. |
| 11-03 | වියළි ආහාර ද්‍රව්‍ය සැපයීම. |
| 11-04 | එළවළු හා මස් මාළු සැපයීම. |
| | |
| **වාහන අළුත්වැඩියාව හා අමතර කොටස් සැපයීම :-** | |
| 12-01 | සියළුම වර්ගයේ මෝටර් රථ අමතර කොටස් සැපයීම. |
| 12-02 | ටයර්, ටියුබ් හා බැටරි සැපයීම. |
| 12-03 | වාහන අළුත්වැඩියා කිරීම. |
| 12-04 | වායු සමන යන්ත්‍ර අළුත්වැඩියාව හා සේවා කිරීම. |
| 12-05 | වාහන කුෂන් වැඩ (ටෙන්ට් රෙදි මැසීම, ජිට් කවර දැමීම) |
| 12-06 | වාහන සේවා කිරීම. |
| | |
| **ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම :-** | |
| 13-01 | ගොඩනැගිලි උපකරණ, ඉදිකිරීම් ද්‍රව්‍ය හා ගොඩනැගිලි සවිකිරීම්, කටුකම්බි ආදි උපකරණ සැපයීම. |
| 13-02 | විදුලි උපකරණ, උදුන්, විදුලි පංකා, ශීතකරණ හා විදුලි ජනක යන්ත්‍ර සැපයීම. |
| 13-03 | තීන්ත වර්ග, වාර්නිෂ් හා තීන්ත ආලේප කිරීමට ගනු ලබන ද්‍රව්‍ය සැපයීම. |
| 13-04 | වීදුරු සැපයීම. |
| 13-05 | ජල හා විදුලි සම්බන්ධතා උපකරණ සැපයීම. (වතුර පොම්ප, වයර් ආදිය) |
| 13-06 | විදුලි කාර්මික සේවා සැපයීම. |
| | |
| **මාර්ග සංවර්ධනය හා අළුත්වැඩියා සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සැපයීම :-** | |
| 14-01 | කළුගල් සැපයීම. |

| | |
|---|---|
| 14-02 | වැලි සැපයීම. |
| 14-03 | බර වාහන සැපයීම. |
| 14-04 | හියුම් පයිප්ප සැපයීම. |
| | |
| **ඉදිකිරීම් හා කොන්ත්‍රාත් :-** | |
| 15-01 | ගොඩනැගිලි ඉදිකිරීම් හා අළුත්වැඩියාව. |
| 15-02 | මාර්ග ඉදිකිරීම් හා අළුත්වැඩියාව. |
| 15-03 | වැව් අමුණු, ඇළ මාර්ග, ක්‍රීඩා පිට්ටනි, ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය. |
| 15-04 | උද්‍යාන අලංකාරකරණය |
| 15-05 | ගෘහ අලංකාරකරණය |
| 15-06 | උපදේශාත්මක සේවාවන් සැපයීම - ඉදිකිරීම් සඳහා උපදේශාත්මක සේවාවන් සැපයීම, සැලසුම් කිරීම, ඇස්තමේන්තු කිරීම හා අධීක්ෂණය. |
| 15-07 | උපදේශාත්මක සේවාවන් සැපයීම - විදුලි ඉංජිනේරු පරිපථ සැලසුම් හා උපදේශාත්මක සේවා සැපයීම (ගොඩනැගිලි) |
| 15-08 | උපදේශාත්මක සේවාවන් සැපයීම - යාන්ත්‍රික ඉංජිනේරු හා මල ප්‍රවාහන / ජලනල පරිපථ සැලසුම් හා උපදේශාත්මක සේවා සැපයීම (ගොඩනැගිලි) |
| | |
| **වෙනත්** | |
| 16-01 | හිස් මිනී පෙට්ටි සැපයීම. |

<u>සටහන</u>

1. ව්‍යාජ ලියවිලි ඉදිරිපත් කරමින් භාණ්ඩ සැපයීමක් සඳහා හෝ සේවාවන් සඳහා ලියාපදිංචි වන ආයතන හෝ පුද්ගලයින් සම්බන්ධයෙන් දැඩි නීතිමය පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ.

2. සියළුම අයදුම්කරුවන් යෝග්‍යතාව පිළිබඳව විමසුමකට ලක් කිරීමෙන් අනතුරුව ලියාපදිංචිය සිදු කරනු ලබන බව කාරුණිකව සලකන්න.

3. මෙම පුවත්පත් දැන්වීම උතුරු මැද පළාත් සභාවේ නිල වෙබ් අඩවිය වන "www.ncp.gov.lk" හි "Publications" යටතේ ඇතුලත් කර ඇති අතර, ලියාපදිංචි කිරීමේ කටයුතු සම්බන්ධයෙන් යම් පැහැදිලි කර ගැනීමක් වෙතොත් **025-2235471** දුරකථන අංකය ඇමතීමෙන් විස්තර ලබාගත හැකිය.

**<u>ලිපිනය :-</u>**
**ප්‍රධාන ලේකම්,**
**ප්‍රධාන ලේකම් කාර්යාලය,**
**උතුරු මැද පළාත,**
**අනුරාධපුරය.**

**ඒ.තලාකොටුනගේ,**
**ප්‍රධාන ලේකම්,**
**උතුරු මැද පළාත.**